**කෝරලේපත්තු ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 08 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වීම. | ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ යන්ත්‍රෝපකරණ හා වාහනවල එකතුව 41 ක් වුවද, ඒ සෑම ඒකකයකම වටිනාකම තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් තක්සේරු කර අවසන් ගිණුම්වලට ගෙනැවිත් නොතිබූ අතර ඒවායේ මුළු | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වීම. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු.12,534,720 ක් පමණක් හෙළිදරව් කර තිබුණි. | | |
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි ලැයිස්තුගත කර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වටිනාකම් තක්සේරු කර අවසන් ගිණුම්වලට ගෙනැවිත් නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර නිවැරදි වටිනාකම ගණනය කර ගිණුම්ගත කළ යුතු වීම. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඇ) | පාඨකයින් විසින් ආපසු භාර නොදුන් රු.391,801 ක් වටිනා පොත් 3,139 ක් සහ විනාශ වූ පොත් 1,921 ක් වටිනාකම තක්සේරු කර අවසාන පොත් තොග ශේෂයෙන් අඩුනොකර වත්කම් ලෙස දක්වා තිබුණි. | අදාළ අයගෙන් අයකර ගැනීමටත් පොත්වලින් ඉවත් කිරීමටත් කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඈ) | ලැබිය යුතු මුද්දර ගාස්තු රු.5,758,400 ක් අවසන් ගිණුම් වලට හෙළිදරව් කර නොතිබුණි. | ලැබිය යුතු දෑ අවසන් ගිණුම්වල හෙළිදරව් කළ යුතු වීම. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඉ) | ලැබිය යුතු උසාවි දඩ ගාස්තු රු.1,018,568 ක් අවසන් ගිණුම්වලට හෙළිදරව් කර නොතිබුණි. | ලැබිය යුතු දෑ අවසන් ගිණුම්වල හෙළිදරව් කළ යුතු වීම. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**1.4 අනුකූල නොවීම්**

**------------------**

**1.4.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව**

**-------------------------------------------------------------------**

| | නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | -------------------------- | ------------------ | ----------------- | -------------------- |
| (අ) | 1988 ප්‍රාදේශිය සභා මූල්‍ය හා පරිපාලන රීතී මාලාව<br>------------------------------- | | | |
| (i) | I පරිශිෂ්ඨයේ 5(XIII) වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම් ආදිය නිලධාරීන් දෙදෙනෙකුට රාජකාරිමය වශයෙන් පවරා දී තිබුණත් ඔවුන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. | ඇප අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | X පරිශිෂ්ඨයේ 193 වගන්තිය | වර්ෂයට අදාළ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය සැලැස්ම සමඟ සංසන්දනය කර විචලනයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු වාර්තාව සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 1645 සහ 1646 | වාහනවලට අදාල සෑම මාසයකම ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහන ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. | මාසිකව ඉදිරිපත් කළ යුතු වීම. | අනාගතයේදී ඉදිරිපත් කරනු ලැබේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,573,659 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,638,507 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 13,064,848 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ විස්තර වරිපනම් හා බදු, කඩ කාමර කුලී, බලපත්‍ර ගාස්තු හා අනෙකුත් ආදායම්වලින් එකතුව රු.28,025,288 ක් අයකිරීමකින් තොරව හිඟහිටව පැවතුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී ආදායම් රැස්කිරීමේ පසු බැසීමක් දක්නට ලැබුණි. පසුගිය වර්ෂයේ මුළු එකතුව රු.28,025,288 ක් හිඟහිටව පැවතුණත්, සමාලෝචිත වර්ෂයේ එකතුව රු.13,596,830 ක් හිඟහිටව පැවතුණි. මෙය සභාවේ ආදායම් සමඟ සැසඳීමේදී විශාල අගයක් ගෙන තිබූ අතර ආදායම් රැස්කිරීමේ මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කෙරුණි. | හිඟ ආදායම් අයකිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. | කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සංචාරක හෝටල් 08 කින් කසල ඉවත්කිරීමේ බදු රු.435,000 ක් අයකර ගැනීමකින් තොරව හිඟහිටව පැවතුණි. | හිඟ ආදායම් අයකිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. | කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

### 2.2.4 කඩ කුලී

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කඩ කුලී, වෙළඳපොල කුලී, ඉඩම් බදු දීම් හා JCB යන්ත්‍ර කුලියට දීම් එකතුව රු.13,161,830 ක් අයකර ගැනීමකින් තොරව හිඟහිටව පැවතුණි. | හිඟ ආදායම් අයකිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. | කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**2.2.5 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රැස්කළ ප්‍රමාණය, බිල්කළ ආදායම් ලෙස දැක්වීම හේතුවෙන් හිඟහිටි කිසිවක් නොපැවැතුණි. | හිඟ ආදායම් දැක්විය යුතුවීම. | අනාගතයේදී ඉදිරිපත් කරනු ලැබේ. |

**2.2.6 අනෙකුත් ආදායම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනෙකුත් ආදායම් ලෙස රු.25,634,000 ක් ඇස්තමේන්තු කර තිබුණත් රු.10,935,353 ක් පමණක් අයකර ගෙන තිබුණි. | ඇස්තමේන්තු කළ ප්‍රමාණය අයකිරීමට කටයුතු කළ යුතු වීම. | අනාගතයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**2.2.7 උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු**

**උසාවි දඩ ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ ගාස්තු රු.1,018,568 ක් සහ මුද්දර ගාස්තු රු.5,758,400 ක් ලැබිය යුතුව පැවතුණි. | නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අනාගතයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

**(අ) කාර්යභාරයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| I | 2017 වර්ෂයේ කලෙයිවානි මාර්ගයත්, විපුලානන්ද මාර්ගයත් සම්බන්ධ කිරීමේ මාර්ගය කානු පද්ධතිය සමඟ ඉදිකිරීම සඳහා සලසා තිබූ රු.මිලියන 02 ක ප්‍රතිපාදන 2019 මාර්තු 31 දින වන විටත්, මාර්ග ඉදිකිරීම සඳහා ක්‍රියාමාර්ග නොගෙන එම මුදල් සුළුණය ගිණුමේ ගිණුම්ගත කර තිබුණි. | සලසා තිබූ ප්‍රතිපාදන අදාළ අරමුණු සඳහා උපයෝජනය කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| II | කෝරකලිමඩු උප කාර්යාල පසු මාර්ගය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ රු.850,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවත්, එම කාර්යය 2019 මාර්තු 31 දින වන විටත් ආරම්භ කර නොතිබූ අතර එම මුදල් සුළු ණය ගිණුමේ ගිණුම්ගත කර තිබුණි. | සලසා තිබූ ප්‍රතිපාදන අදාළ අරමුණු සඳහා උපයෝජනය කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

**(ආ) තිරසාර සංවර්ධන අරමුණු**

| | | |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | අනාගතයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය නිවැරදි ආකාරයෙන් කළමනාකරණය නොකිරීම හේතුවෙන් අලුතින් ඉදිකර තිබූ ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානයට අවසර පත්‍ර මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබා දී නොතිබුණි. මේ නිසා දිරාපත් වන කසළවලින් කාබනික පොහොර නිපදවා නොතිබුණි. | අවසර පත්‍ර ලබාගත යුතුය. කාබනික පොහොර නිෂ්පාදනය කළ යුතු වීම. | අනාගතයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලියාපදිංචි කළ සංචාරක නිකේතනවලින් ඒවායේ මුළු ආදායමින් 1%ක බදු වර්ෂ 10 ක සිට අයකරගෙන නොතිබුණි. | බදු අයකිරීමට කටයුතු කළ යුතු වීම. | තීරණයක් ගත නොහැකි විය. |
| (ආ) | පුද්ගලයින් 83 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ කුලී රු.11,844,640 ක 1993 වර්ෂයේ සිට දීර්ඝ කාලයක් දක්වා අයනොකර හිඟහිටව පැවතුණි. | බදු අයකිරීමට කටයුතු කළ යුතුය. නැතහොත් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. | කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඇ) | අංක LA 3604 දරන ගලි බවුසරය 2010 වර්ෂයේ සිදු වූ සුළු අලුත්වැඩියාවක් හේතුවෙන් එය වහාම අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර වර්ෂ 09 ක් ගතවීමෙන් පසුව රු.මිලියන 01 ක් වැයකර 2018 වර්ෂයේදී අලුත්වැඩියා කර තිබුණි. නමුත්, අදාළ ලියකියවිලි ලැබී නොතිබූ හෙයින් 2019 මාර්තු දක්වා ක්‍රියාත්මක නොවී නැවතත් නවතා තිබුණි. | අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වීම. | කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවේ සමාලෝචිත වර්ෂයේ ජංගම බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන මුදල් පොත අනුව, රු.මිලියන 25 සිට රු.මිලියන 30 දක්වා පරාසයකින් අතැති මුදල් තිබූ නමුත් එය ඵලදායී ආකාරයෙන් ආයෝජනය කර ආදායම් ඉපැයීමට කටයුතු නොකිරීම නිසා සභාව විසින් ආසන්න වශයෙන් රු.මිලියන 02 ක ආදායමක් අහිමි කර තිබුණි. | නියමිත අතැති මුදල් ශේෂය පවත්වාගෙන ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වීම. | අනාගතයේදී අවධානය යොමු කෙරේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ මාර්ග 23 කට රු.3,032,600 ක වටිනාකමට බොරළු දමා තිබුණි. ඇතැම් මාර්ගවලට කාර්යය අවසන් වීමෙන් පසුව තක්සේරු වාර්තා පිළියෙල කර තිබූ අතර ඒ සඳහා බොරළු ක්‍රමවත්ව තලා නොතිබීමෙන් වැසි අවස්ථාවලදී එම මාර්ග ඉක්මනින් හානියට පත්විය හැකිය. | | |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පූර්ව අනුමැතිය සහ එකඟතාවය ලබා නොගෙන 2015 වර්ෂයේ සේවකයන් 15 දෙනෙකුත්. 2017 වර්ෂයේ සේවකයන් 48 දෙනෙකුත් බඳවාගෙන තිබුණි. මේ නිසා අනුමත සේවක සංඛ්‍යාවට අතිරේකව සේවකයන් 68 දෙනෙකු දක්නට ලැබුණි. | අතිරික්ත මානව සම්පත් විධිමත් ආකාරයෙන් යෙදවිය යුතුවීම. | අනාගතයේදී සැලකිල්ලට ගනු ලැබේ. |
| (ආ) | වර්ෂ 05 කට පෙර සේවය අත්හැර ගිය සේවකයන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.221,952 ක හිඟ ණය අදාළ පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි. | අදාළ පුද්ගලයන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | |

**3.4 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ අවසන් ගිණුම්වල සුළු ණය ගිණුමේ රු.1,813,900 ක් බොරළු සැපයීම වෙනුවෙන් "රමාා" බෙදාහරින්නන්ට ගෙවිය යුතු බව සඳහන් වුවත් ඔහු විසින් බොරළු සපයා තිබූ බවට කිසිඳු සාක්ෂියක් නොවීය. | විමර්ශනය කර කඩිනමින් සුදුසු පියවර ගත යුතු වීම. | නිවැරදිව අදහස් දක්වා නැත. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සභාවට අයත් සියළුම ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන ඒවා සලකුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙන නොතිබුණි. | වත්කම් හඳුනාගෙන ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අනාගතයේදී කටයුතු කරනු ලැබේ. |

**3.6 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුස්තකාල 05 කින් පාඨකයින් විසින් ලබාගත් ආපසු භාර නොදුන් රු.391,801 ක් වටිනා පොත් 3,139 ක් සම්බන්ධයෙන් ඒවා ආපසු ලබාගැනීමට හෝ එහි වටිනාකම අදාළ පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | පාඩු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ විථී විදුලි පහන් සවිකිරීම සඳහා රු.1,514,815 ක් වැයකර තිබුණි. | පාඩුව අයකළ යුතුවීම. | තීරණ ගෙන නොමැත. |

| | | |
|---|---|---|
| මෙහිදී ලැබීම් සහ නිකුත් කිරීම් මුදල් රෙගුලාසි 751(1) ප්‍රකාරව ලේඛනවල විධිමත් අයුරින් ලේඛනගත කර නොතිබුණි. අවශ්‍යතාවය සහ මහජන ඉල්ලීම් පිළිබඳ අවධානය යොමු නොකර අවශ්‍යතාවයට වැඩියෙන් මිලදී ගෙන තිබුණි. තවද, ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් අයුරින් අනුගමනය නොකිරීම නිසා මිලදී ගැනීමේදී සභාවට රු.66,500 ක් පාඩුවක් සිදු වී තිබුණි. | | |

**3.7 ප්‍රසම්පාදනය**

---------------

**3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර එයට අනුව මිලදී ගැනීම් සිදුකර නොතිබුණි. | වාර්ෂිකව මෙම සැලැස්ම පිළියෙල කළ යුතු වීම. | ඉදිරියේදී පිළියෙල කරනු ලැබේ. |

**3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී සභාවට අයත් ඉඩමේ වෙළඳපොළ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගිවිසුම්ගතව රු.924,053 ක් ගෙවීමෙන් අනතුරුව වෙනත් පුද්ගලයෙකු විසින් නීති විරෝධී ආකාරයෙන් අයිතිවාසිකම් පෑම නිසා කාර්යයන් මෙතෙක් ආරම්භ කර නොතිබුණි. | කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

**(ආ) මාර්ගවලට බොරළු දැමීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන චක්‍රලේඛයේ 1.2 ඡේදය ප්‍රකාරව මූලධන ප්‍රතිපාදනවලින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා මාර්ග ඉදිකිරීම සඳහා බොරළු දැමීම හා තාවකාලික මාර්ග ඉදිකිරීම වලක්වා දිගුකාලයක් භාවිතා කළ හැකි ආකාරයට කාපට් දැමීම, තාර දැමීම නැතහොත් කොන්ක්‍රීට් දැමීම සිදුකළ යුතු බව සඳහන් කර තිබුණි. එසේ වුවත්, එයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ මාර්ග 23 කට රු.3,032,630 ක වියදමින් බොරළු දමා තිබුණි. | චක්‍රලේඛ අනුගමනය කළ යුතු වීම. | අනාගතයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**3.7.3 ලැබිය යුතු හා ගෙවිය යුතු දෑ**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ විවිධ අරමුණු සඳහා අත්තිකාරම් ලෙස ලබාදුන් රු.949,991 ක් අයකර ගැනීමට (නිරවුල් කිරීමට) කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | සංචාරක හෝටල් 09 කින් අයකළ යුතු කසල ඉවත්කිරීමේ හිඟ ගාස්තු රු.435,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඇ) | සභාව සතු JCB යන්ත්‍රය කුලියට ලබාදුන් අවස්ථා 21 කදී රජයේ ආයතන සහ තනි පුද්ගලයින්ගෙන් අයකළ යුතු රු.1,310,600 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇස්තමේන්තු කළ ආදායමට වඩා ඉතා අඩු ආදායමක් අයකර ගෙන ඇති බැවින් අයවැය එක් පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය. | පසුගිය වර්ෂ හා ඉදිරි වර්ෂය සැලකිල්ලට ගනිමින් අයවැය පිළියෙල කළ යුතු වීම. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | ඇස්තමේන්තු වටිනාකම | තථ්‍ය වටිනාකම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බදු | 16,672,000 | 525,770 | 16,146,230 |
| කුලී | 14,345,000 | 9,989,969 | 4,355,031 |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට වරක් හෝ පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී කිසිදු කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. | විගණන කමිටු රැස්වීම් පවත්වා ගැටළු සඳහා විසඳුම් ලබාගත යුතුවේ. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |